# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය - 2017 හතරවන කාර්තුව

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

**දුර. අංකය : 011-2147446** **ෆැක්ස් : 011-2147447** **ඊමේල් : sample.survey@statistics.gov.lk**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේ හතරවන කාර්තුව (ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර්) සඳහා ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කොට ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් රටේ රැකියා නියුක්තිය, රැකියා වියුක්තිය හා ශ්‍රම බලකාය වැනි සංඛ්‍යාති රැසක වෙනස්වීම් පිළිබඳ කාලීන දත්ත ඉදිරිපත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය පවත්වනු ලබයි. මෙම සමීක්ෂණය 1990 වසරේ සිට කාර්තුමය පදනමක් යටතේ වාර්ෂිකව පවත්වාගෙන යනු ලබයි. 2017 හතරවන කාර්තුව එම සමීක්ෂණ මාලාවේ 105 වැන්නයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මුළු දිවයිනම ආවරණය වන පරිදි නිවාස ඒකක 6,440 ක නියැදියක් මඟින් රැස් කළ තොරතුරු භාවිතයෙන් 2017 වසරේ හතරවන කාර්තුව සඳහා ශ්‍රම බල සංඛ්‍යාති නිකුත් කර ඇත.

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් වයස අවු. 15 හා ඊට වැඩි ජනගහනය වැඩ කරන වයසේ පසුවන ජනගහනය ලෙස සලකනු ලැබේ. 2017 වසරේ හතරවන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත වැඩ කරන වයසේ පසුවන ජනගහනය මිලියන 15.9 ක් ලෙස වාර්තා වේ.

වැඩකරන වයසේ ජනගහනය අතුරින් සලකනු ලබන සමීක්ෂණ යොමු කාලය වන සතිය තුල රැකියා නියුතු හෝ රැකියා විරහිත මුළු ජනගහනය ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය හෙවත් ශ්‍රම බලකාය වේ. 2017 වසරේ හතරවන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය මිලියන 8.6 ක් ලෙස වාර්තා වේ. ඒ අතරින් 63.6% ක් පුරුෂයන් වන අතර 36.4 % ක් ස්ත්‍රීන් වේ.

ශ්‍රම බලකායට අයත් වන පුද්ගලයින් සංඛ්‍යාව, වැඩකරන වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට ශ්‍රම බල සහභාගිත්ව අනුපාතය (LFPR) ලෙස හඳුන්වනු ලබයි. 2017 වසරේ හතරවන කාර්තුවට අදාල සමීක්ෂණ ප්‍රතිඵල වලට අනුව ශ්‍රී ලංකාවේ සමස්ථ ශ්‍රම බල සහභාගිත්ව අනුපාතය 54.1% ක් වන අතර පුරුෂයින් හා ස්ත්‍රීන් සඳහා ශ්‍රම බල සහභාගිත්ව අනුපාත පිළිවෙළින් 74.9% හා 36.4 % වේ.

පුද්ගලයෙකු අදාල සමීක්ෂණ යොමු කාලය තුල අවම වශයෙන් පැයක්වත් වැටුප් ලබන සේවකයෙකු, සේවායෝජකයෙකු, තමාගේ වැඩ කටයුතු කරන්නෙකු හෝ පවුලේ ආර්ථික කටයුතු වලට දායකවන්නෙකු ලෙස කිසියම් වැඩක නිරත වුයේ නම් එම පුද්ගලයා රැකියා නියුතු පුද්ගලයෙකු ලෙස හඳුන්වනු ලබයි. මෙම කාර්තුව සඳහා ඇස්තමේන්තුගත රැකියා නියුක්තිකයින් ප්‍රමාණය මිලියන 8.3 ක් වේ. ඒ අතුරින් 44.7% ක් සේවා අංශයේ ද 28.3 % ක් කර්මාන්ත අංශයේ ද 27.0 % ක් කෘෂිකාර්මික අංශයේ ද රැකියා වල නිරත වී ඇත. මෙහිදී ඉහලම සේවා නියුක්තියක් සේවා අංශයේ දක්නට ලැබෙන අතර, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම එම රටාව දක්නට ලැබේ. මෙහිදී කෘෂිකාර්මික අංශයේ නියෝජනය අවම අගයක් ගනී. තවද 2017 වසරේ හතරවන කාර්තුවේදී රැකියා නියුක්තිකයින්ගෙන් 67.9 % ක් සතියකට පැය 40 කට වඩා වැඩ කර ඇති බව වාර්තා වී ඇත.

අදාල සමීක්ෂණ යොමු කාලය තුල රැකියාවක් නොමැති, සමීක්ෂණයට පෙර සති 4 ක කාලය තුල රැකියාවක් සොයමින් සිටි හා රැකියාවක් සෙවීමට කිසියම් ක්‍රියා මාර්ගයක් ගත්, ඉදිරි සති 2 තුල රැකියාවක් ලැබුණහොත් එය කිරීමට හැකියාව ඇති පුද්ගලයින් රැකියා විරහිත පුද්ගලයින් සේ සලකනු ලබයි. මුළු රැකියා විරහිත පුද්ගලයින් සංඛ්‍යාව, ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ගත්විට විරැකියා අනුපාතය ලෙස හඳුන්වනු ලබයි. 2017 වසරේ හතරවන වන කාර්තුවේදි ඇස්තමේන්තුගත විරැකියා අනුපාතය 4.0 % ක් වේ.

2017 වසරේ තෙවන කාර්තුවට අදාළ ශ්‍රම බල සංඛ්‍යාති පිළිබඳ තොරතුරු ඇතුලත් සංක්ෂිප්ත වාර්තාවක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි (www.statistics.gov.lk) ප්‍රකාශයට පත් කර ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වැ.බ.අධ්‍යක්ෂ ජනරාල් අයි.ආර්.බණ්ඩාර මහත්මිය පවසයි.